# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2091/61 - 2018 ඔක්තෝබර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2018.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 243 උප්පුවෙලි ග්‍රාම සේවා වසමේ ත්‍රිකුණාමලය නගර හා කඩවත් සර්වේ ජනරාල් විසින් 2018.08.10 දිනැතිව පිළියෙල කරන ලද FVP 27, FVP 29 දරන පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3.3712, හෙක්ටයාර් 0.0166, හෙක්ටයාර් 0.0632 පමණ වූ කැබලි අංක 1379, 1896, 1897 දක්වා ඉඩමට මායිම් විස්තර පහත සඳහන් කර ඇත.

**කැබලි අංක 1379**

උතුර කැබලි අංක: කැබලි අංක 2; නැගෙනහිර කැබලි අංක: කැබලි අංක 104, 1898 සහ FVP 29; දකුණ කැබලි අංක: කැබලි අංක 2, 104, 1898, 1897, 102, 2, 1896 සහ 102, FVP 29; බටහිර කැබලි අංක: කැබලි අංක 2, පාර(මාර්ග සංවර්ධන අධිකාරිය) සහ කැබලි අංක 2; ප්‍රමාණය: හෙක්ටයාර් 3.3712.

**කැබලි අංක 1896**

උතුර කැබලි අංක: කැබලි අංක 1378, 2 හි FVP 27 සහ කැබලි අංක 102; නැගෙනහිර කැබලි අංක: කැබලි අංක 102; දකුණ කැබලි අංක: කැබලි අංක 102; බටහිර කැබලි අංක: කැබලි අංක 102, 2 සහ 1378 FVP 27; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0166.

**කැබලි අංක 1897**

උතුර කැබලි අංක: කැබලි අංක 1378, 2 FVP 27 සහ කැබලි අංක 1898; නැගෙනහිර කැබලි අංක: කැබලි අංක 1898, 1899 සහ කැබලි අංක 102; දකුණ කැබලි අංක: කැබලි අංක 102; බටහිර කැබලි අංක: කැබලි අංක 2 සහ 1378 FVP 27; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0632.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018.10.29 වැනි දින පෙ.ව. 10.00ට ප්‍රාදේශීය ලේකම් වන මා සම්මුඛ විය යුතු ය.

තව ද 2018.10.08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ජේ.එස්. අරුල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
නගර හා කඩවත් කොට්ඨාසය.

2018 සැප්තැම්බර් මස 26 වැනි දින,
ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-1115